"මෙහෙකාරිය" ද? ගෘහ සේවිකාව ද?
යම් ජන සමාජයක චින්තනය හැඩගැස්වීමෙහි ලා, භාෂාවේ බලපෑම සුළු පටු නොවේ. එසේම, එම භාෂාව සඳහා මාධ්‍ය වෙතින් ලැබෙන දායකත්වය ද එසේම නොසලකා හැරිය හැකි නොවේ. අතීතයේ භාවිතා වූ ඇතැම් යෙදුම්, වර්තමානයට ද එසේම උචිත වන්නේ ද යන පැනය, පාඨක අප නැඟිය යුත්තේ ඒ හෙයිනි. නිදසුන් ලෙසට, "මෙහෙකාරිය", "මෙහෙකරුවා" වැනි යෙදුම් අතීතයේ ඇතැම් වෘත්තීන් සම්බන්ධයෙන් තිබූ පසුගාමී අදහස් නියෝජනය නොකරන්නේදැයි පාඨක අප ඇසිය යුතු වේ. එසේ නම්, වර්තමානයේදී වඩාත් නිදහස්, වෘත්තිමය සම්බන්ධතාවයන් බවට පත්ව ඇති එම වෘත්තීන් හැඳින්වීම සඳහා වඩාත් යෝග්‍ය යෙදුම් භාවිතා කළ යුතු නොවන්නේ ද යන පැනය ද පැන නඟී.
ඉහත පසුබිමේ දී, ව්‍යාපාරික කාන්තාවක් විසින් කරන ලද පැමිණිල්ලක් අනුව සැකපිට අත්අඩංගුවට ගැනුණු, නිවසේ ගෘහසේවිකාව ලෙසින් සේවය කළ කාන්තාවක්, පොලිස් අත්අඩංගුවේ පසුවන අතරතුර අසනීප වී ජාතික රෝහලට ඇතුළත් කිරීමෙන් පසුව මියයෑමේ සිදුවීමට සම්බන්ධ පුවතක්, පුවත්පත් තුනක් තුළ දැක්වී ඇති ආකාරය සලකා බැලිය හැක.
මෙහිදී, ලංකාදීප, අරුණ, දිවයින පුවත් වාර්තාවන් තුනෙහිම, අදාළ කාන්තාව හැඳින්වී ඇත්තේ "මෙහෙකාරිය" ලෙසිනි.
ඔබ සිතන ලෙසට,
1) මෙවන් නාමකරණයන් ඔස්සේ වර්තමානයේ පවත්නා සේවානියුක්ත-සේවායෝජක සම්බන්ධතාවයට වඩා වෙනස් වූ ස්වාමි-සේවක සම්බන්ධතාවයක් හැඟවෙන්නේ නැතිද? "මෙහෙකාරිය" වැනි වදන් ඔස්සේ වඩාත් පසුගාමී සමාජ සම්බන්ධතාවයක් නොපෙන්වන්නේ ද?
2) "මෙහෙකාරිය" වැනි යෙදුම් වෙනුවට "ගෘහ සේවිකාව" වැනි යෙදුමක් වඩාත් උචිත නොවන්නේද? එසේ නැතිනම් ඊට වඩාත් යෝග්‍ය වෙනත් යෙදුම් ඔබට යෝජනා කළ හැකිද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# "මෙහෙකාරිය" ද? ගෘහ සේවිකාව ද?



මෙහෙකාරියගේ අබිරහස් මරණය

පොලිසියේ හතරකගේ වැඩ තහනම්

තුනකට මාරු

ඕ.අයි.සීත් මාරු කරන්නැයි පොලිස්පති ලේකම්ගෙන් ඉල්ලයි

ලංකාදීප



කෝටිපති නිවසේ සිටි මෙහෙකාර කත මියයෑම

වැලිකඩ පොලිසියේ 4 කගේ වැඩ තහනම්: 3 කට ස්ථාන මාරු

OIC ත් වැට උඩ - විමර්ශන සීඅයිඩීයට

දිවයින



පොලිසියේ සිවු දෙනකුගේ වැඩ තහනම්

කොළඹ ප්‍රකට ව්‍යාපාරික කාන්තාවක මෙන්ම චිත්‍රපට නිෂ්පාදිකාවක ද වන සුධර්මා නෙත්තිකුමාරගේ රාජගිරියේ පිහිටි නිවසේ රන් මුදුවක් අස්ථානගත වූ බවට වැලිකඩ පොලිසියට කළ පැමිණිල්ලකට අනුව නිවසේ මෙහෙකාරියක ලෙස සේවය කළ පස්සර මඩොල්සීම ප්‍රදේශයේ පදිංචි ආර්. රාජ්කුමාර් නමැති 42 හැවිරිදි කාන්තාවක

අරුණ

මැයි 22, 2023 දින තෝරාගත් සිංහල පුවත්පත් දත්ත ඇසුරිණි.